ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

# පෙරහුරු පරීක්ෂණය - 2017

| 11 ශ්‍රේණිය | සිංහල සාහිත්‍ය රසාස්වාදය | කාලය පැය තුනයි. |
|---|---|---|

- **I කොටසෙහි <u>1, 2 ප්‍රශ්නවලටත්</u>, II කොටසෙහි <u>3 වැනි ප්‍රශ්නයටත්</u> III කොටසෙහි 4, 5, 6, 7 ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න <u>දෙකකටත් </u>උත්තර සපයන්න .**

**<u>I කොටස</u>**

01. I සිට V තෙක් ඇති කොටස් කියවා, ඒවා ඇසුරින් අසා ඇති (අ), (ආ) ප්‍රශ්න වලට කෙටි උත්තර ලියන්න.

i. "ශජ්, කට වහගෙන ඉන්න බැරි ද?".
(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?
(ආ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කා හට ද?

ii. "මැණියන් වහන්ස, මම චණ්ඩාල ස්ත්‍රියක් නොවෙමි.".
(අ) මම යනු කවුරුන් ද?
(ආ) මෙම ප්‍රකාශය ඇතුලත් නිර්දිෂ්ට ග්‍රන්ථය කුමක් ද?

iii. "මෙතෙක් බර උසුලාගෙන දවස කොතෙක් තැන් යවුදැ යි විචාළීය.".
(අ) මෙසේ ඇසුවේ කවුරුන් ද?
(ආ) මෙම කොටස ඇතුළත් කතාව සඳහන් මුල් කෘතිය කුමක් ද?

iv. "නැගෙතත් අවරගිර ගිරගින් <u>**දිනකර**</u> මඬල
සැලෙතත් <u>**සුනෙර**</u> පවනින් සෙදෙතත් අනල
පිපෙතත් ගිරි මුඳුන හෙල් මැලි පියුමුපුල
බොරු නැත්තෙ මය මහතුන් පැවසු තෙපුල".
(අ) මෙහි අවසන් පද පේළි <u>**දෙකෙහි**</u> අරුත ලියන්න.
(ආ) ඉරි ඇඳි පද දෙකෙහි අරුත් ලියන්න.

v. "කටට ගැන්ම ද බෝ මැ අමාරු වු
කරදියත් ඔබ ගත් කලැ සාගරෙන්
මිහිරිවෙයි උතුමන් සහ වාසයෙන්
නිවටයෝ ද උසස් වෙති බෝ සෙයින්".
(අ) නිවටයෝ උසස් වන්නේ කුමන හේතුවෙන් ද?
(ආ) මෙම පැදිපෙළ රචනා කොට ඇත්තේ කවුරුන් ද?

(ලකුණු 4 x 5 = 20 යි)

02. පහත දී ඇති පැදි පෙළ කියවා අසා ඇති ප්‍රශ්න උපයෝගී කොට ගෙන රසාස්වාදයක් ලියන්න.

ගොඩේ කන්දෙ මූකලාන කම්පා කරමින්නේ
රුස්සයෙකි රෑ පාළුව බිඳගෙන ඇද වැටුණේ
අඩ නින්දෙට පන් පැඳුරට උණු කඳුළක් හැලුණේ
මූකලාන පස් වැටියක් වී හීනෙන් පෙනුණේ

යස දරුවන් ගෙන ඇකයෙන් කැපුවත් නොසැලෙන්නේ
දුක් කරදර කෝටියක්ම ගිලගෙන හිනැහෙන්නේ
සියතින් මර විපත කටින මිනිසුන් දකිමින්නේ
මහා පුරුෂයෙකු වාගේ කන්ද නැගී ඉන්නේ

www.edudept.up.gov.lk

පිරුණු ලොරිය ගම් දොරකඩ පියමං කර යනවා
පාර වුණත් හිරිහැරයක් නෑ ඔහෙ නිදියනවා
පැලේ වහල ඇද හැළිලා මාසයක් වෙනවා
පරාල තුනකට අයියා හිරේ හුහුං ලනවා

පොරොව, කියත කලුවරේ ම පණ ආවා ලෙසිනේ
මගෙ ඇඟ අඩ පට්ටල් බැඳ කපනු ඉරනු වැන්නේ
දෙයියන්ගේ මල්ලිලාට දෙවියොම රැවටෙන්නේ
කාන්තාර ගම මායිම් තවත් පුළුල් වෙන්නේ

i. රචකයා යොදා ඇති අත්දැකීම කුමක් ද?
ii. කවියා යොදා ඇති ආකෘතිය අත්දැකීම රසවත් ව ඉදිරිපත් කිරීම සඳහා කොතෙක් දුරට උචිත වන්නේ ද?
iii. කවියා තම අත්දැකීම ප්‍රබල ව ඉදිරිපත් කිරීමට යොදා ගත් යෙදුම් දෙකක් නම් කරන්න.
iv. කාන්තාර ගමෙහි මායිම් පුළුල් වන්නේ කුමන හේතුව නිසා ද?
v. කවියා යොදාගත් භාෂාව අත්දැකීම රසවත් ව ඉදිරිපත් කිරීම සඳහා යොදාගත් ආකාරය කොතෙක් දුරට ගැළපේ ද?

(5 x 5 = 25)

**<u>II කොටස</u>**

- පහත දැක්වෙන ගද්‍ය පද්‍ය කොටස් දෙකින් එක් කොටසකට පමණක් උත්තර සපයන්න.

03. ඒකල බෝධිසත්ත්වයෝ ප්‍රභාවතීන් නිසා සත්රජ්ජුරු කෙනෙක් මෙනුවර වටලා ගත්තාහයි යනු අසා අද දවස් මාගේ මනෝරථය මුදුන් පැමිණින්නේ යයි මාගේ මේ ගමට ආ නියාව අද දවස් ප්‍රභාවතී දෙමව්පියන්ට කියන්නීය. ඒ අසා මා ගෙන්වා ගෙන උන් මට පාවා දෙති. එකල මා ගත් දුක් සාර්ථක වන්නේ යයි වලං සෝදා තැන්පත් කොට තබමි සිතා පැන් ගෙනවුත් වලං සෝදන්නට පටන් ගත්හ. එසඳ වලං සෝදමින් සිටි රජ්ජුරුවන් දැක දියණියන්ට උරණව "කෙල්ල, තෝ චණ්ඩාල එකක් ද, අවශේෂ හීන ජාතියෙහි එකක් ද නොහොත් මෙබදු රාජ වංශය නසන්නට උපන් එකක් ද මදු රජ කුලයෙහි උපන් තෙල සකල රාජ මෞලිමාණික්‍යකාන්තීන් බබළන ලද පාදපීඨ ඇති තොපගේ වල්ලභ වූ කුස රජහු ලවා දාස ක්‍රියා කරම් දැයි පරිභව බිණුය."

ඉක්බිති ප්‍රභාවතී තොම මාගේ මැණියන් වහන්සේ මා නිසා මේ කුස රජ්ජුරුවන් වහන්සේ අවුත් මෙනුවර වසන බව නොදන්නා සේක් වනැයි සිතා මැණියන් වහන්ස, මම චණ්ඩාල ස්ත්‍රියක් නොවෙමි. සෙසු හීන ජාති ඒකකත් නොවෙමි. නුඹ වහන්සේගේ රාජ වංශය නසන ඒකකත් නොවෙමි. මේ ඉක්ෂවාකු රාජ වංශයට නගන ලද කේතුවක් වැනි රජ්ජුරුවන් වහන්සේ යයි දනිමි. ඉදින් නුඹ වහන්සේ දාස කෙනෙකු යැයි නොසිතමි.

i. මෙහි සඳහන් බෝධි සත්ත්වයන්ගේ මනෝ රථය කුමක් ද?
ii. පබාවතී අපන් කුලය ලෙස දක්වා ඇත්තේ කුමක් ද?
iii. කුස ජාතක කතාකරු භාෂාව හසුරුවා ඇති ආකාරය උදාහරණ සහිත ව කෙටියෙන් පහදන්න.
iv. පබාවතියගේ ක්‍රියාකලාපය නිසා කුස රජු විඳි දුක් ගැහැට පහදන්න.

**නැතහොත්**

පුතු ඉපදුණු මේ පොළොවේ
උරුමය පුතුටයි
ඒ පොළොවේ ඔද තෙද ගුණ
පුතුහට පිහිටයි.
විහාරමහා මැණිවරුන්
ඉපදුණු පොළොවයි
මද්දුම බණ්ඩාර පුතුන්
ඉපදුණු පොළොවයි
රාසිහ මහසෙන් දෙවිඳුන්
ඉපදුණු පොළොවයි
මින් මතුවට ඒ පොළොවේ

www.edudept.up.gov.lk

උරුමය පුතුටයි.

මහ සෑ රන් කොත මුදුනේ
ගන රන් කිරණයි
සිරිමා බෝ මැඩ සෙවණේ
සිහිලැල් පවනයි
දළදා හිමි රැඳි විමනේ
බුදු රැස් දහරයි.
හැමදා හැම දුක් දුරලා
පුතු සිත සනසයි.

සතර අතින් මුහුද නැඟී
පවුරු සදාලයි
වෙරළ දිගින් මුතු මතු වී
යසස උදා වෙයි.

පොළොව පලා මිණි රුවනින්
ඉසුරු ගලා එයි
පොළොව එවන් පුතු උරුමෙන්
ලැබුව නිදානයි.

i. මෙම පද්‍ය පන්තියෙන් දේශාභිමානි හැඟීම් දනවන දසුන් නිදසුන් දෙකක් ඉදිරිපත් කරන්න.
ii. පද්‍ය පන්තිය සඳහා යොදා ගෙන ඇති බස් වහර එහි සාර්ථකත්වය උදෙසා බළපා ඇති අයුරු කෙටියෙන් පහදන්න.
iii. ආගමික හැඟීම් ඉස්මතු වන වගන්ති දෙක උපුටා ලියන්න.
iv. දේශය පිළිබඳ අභිමානනීය හැඟීම් ඉස්මතු කර දැක්වීමට කවියා ගෙන ඇති උත්සාහය පැදි පෙළ ඇසුරෙන් විමසන්න.

<u>**III කොටස**</u>

04. ළමා සිතිවිලි හා ළමා මනස ක්‍රියා කරන අන්දම "වෙසක් පහන" කෙටි කතාවේ මනා ව නිරූපණය කෙරේ. උදාහරණ සහිත ව විමසන්න.

05. "මහ" කවි පෙළෙන් ඉස්මතු කරන ජීවන දෘෂ්ටිය පිළිබඳ පැහැදිලි කරන්න. (උදාහරණ සහිත ව)

06. සද්ධර්මරත්නාවලියේ සුවිශේෂ ලක්ෂණය වුයේ රසවත් කතාන්දරයක ගැඹුරු දහම් කරුණු අන්තර්ගත කර තිබීමයි. "නන්ද වස්තුව" ඇසුරෙන් (උදාහරණ සහිතව) විමසන්න.

07. කුස ජාතකය කියවන විට දී හෝ අසා සිටින විට දී අපූර්ව වාග් චිත්‍ර මැවීම එම කතා පුවතේ විශේෂත්වයකි. එවන් අවස්ථා තුනක් ගෙන දක්වමින් විස්තර කරන්න.

www.edudept.up.gov.lk